# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.26 පැය 0605 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1886 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**01. මනුෂ්‍ය ඝාතනයක් - ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසම.**

2024.12.25 වන දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ වදුල්ලවත්ත ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් පහරකෑමට ලක්වූ පුද්ගලයෙකු කොළඹ ජාතික රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වූ කොලොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු එම ප්‍රදේශයේම පදිංචි පුද්ගලයෙකු සමඟ තිබූ ආරවුලක් දුරදිගයාම හේතුවෙන් එම පුද්ගලයා විසින් මෙම ඝාතනය සිදු කර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇති අතර ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. දිය අනතුරකින් විදේශීය ජාතිකයන් සිව් දෙනෙකු බේරා ගැනීම - හික්කඩුව පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.**

2024.12.25 වන දින උදෑසන කාලයේ හික්කඩුව පොලිස් වසමේ හික්කඩුව වෙරළ තීරයේ දිය නාමින් සිටි විදේශීය ජාතිකයන් සිව් දෙනෙකු දියේ ගසාගෙන යමින් සිටියදී එම ස්ථානයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් වහාම ක්‍රියාත්මක වී ඔවුන් නිරුපද්‍රිතව බේරා ගෙන ඇත.

**එම විදේශිකයන් අවුරුදු 33 ත් 48 ත් අතර වයස්වල පසුවන රුසියානු ජාතිකයන් වේ.**

හික්කඩුව පොලිස් ස්ථානයේ පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ පොලිස් පරික්ෂක හේවගේ, උප පොලිස් පරීක්ෂක දේශප්‍රිය, පොලිස් කොස්තාපල්වරුන් වන 94998 හේමකුමාර, 99492 කණිෂ්ක, 101510 අදීශ, 102715 ඩිලාන්, 102748 දිසානායක හා 105456 ජයසිංහ යන නිලධාරීන් විසින් මෙම දිවි බේරා ගැනීම සිදු කර ඇත.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.12.25 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 500 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2024.12.25 වන දින දහවල් කාලයේ මොරටුව පොලිස් වසමේ මාදංගහවත්ත ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 120 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බුලත්සිංහල පොලිස් වසම.

2024.12.25 වන දින සවස් කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ කඳන්වාඩිය ප්‍රදේශයේදී බුලත්සිංහල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධී මත්පැන් ලීටර් 67.5 ක් සහ **ගෝඩා ලීටර් 547 ක් (බැරල් 05 ක්) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹගල්ල පොලිස් වසම.

2024.12.25 වන දින සවස් කාලයේ දඹගල්ල පොලිස් වසමේ උඩුමුල්ල ප්‍රදේශයේදී දඹගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගෝඩා ලීටර් 509 ක් (බැරල් 03 ක්) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වූ උඩුමුල්ල, දඹගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දඹගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාන්කුලම් පොලිස් ස්ථානය.

2024.12.25 වන දින උදෑසන කාලයේ මාන්කුලම් පොලිස් වසමේ කෙලවන්කුලම් ප්‍රදේශයේදී මාන්කුලම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන කෙලවන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. බඳින තුවක්කුවක් පත්තුවී පුද්ගලයෙකු තුවාල ලැබීම - දඹගල්ල පොලිස් වසම.**

2024.12.25 වන දින සවස් කාලයේ දඹගල්ල පොලිස් වසමේ බදුළුඔය වැව රක්ෂිත ප්‍රදේශයේදී බඳින තුවක්කුවක් පත්තුවීමෙන් පුද්ගලයකු තුවාල ලබා මොණරාගල රෝහලට ඇතුළත් කර ඇති බවට දඹගල්ල පොලිස් ස්ථානයට ලද තොරතුරකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 53 ක් වන නාමල්ඔය ජනපදය, දඹගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම තුවක්කුව බඳින පුද්ගලයින් පිළිබඳ මෙතෙක් තොරතුරු අනාවරණය වී නොමැති අතර, දඹගල්ල පොලිසිය වැඩිදුර විමර්ශනය සිදු කරනු ලබයි.

**09. දියේ ගිලී පුද්ගලයන් තිදෙනෙකු අතුරුදහන්වීම - තිරුක්කෝවිල් පොලිස් වසම.**

2024.12.25 වන දින සවස් කාලයේ තිරුක්කෝවිල් පොලිස් වසමේ සංගමන්කන්ද ප්‍රදේශයේ මුහුදේ දිය නාමින් සිටි පුද්ගලයන් දෙදෙනෙකු දියේ ගිලී ගසාගෙන යමින් සිටියදී, ඔවුන් බේරා ගැනීමට පුද්ගලයෙකු උත්සාහ කර ඇති අතර එහිදී ඔවුන් තිදෙනාම දියේ ගිලී අතුරුදහන්ව ඇති බවට තිරුක්කෝවිල් පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**අතුරුදහන්වූ තිදෙනා අවුරුදු 15, 17 හා 38 වයස්වල පසුවන සංගමන්කන්ද ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

නාවික හමුදාව, පොලිසිය සහ ප්‍රදේශවාසීන් එක්ව අත්රුදහන්වූ අයවලුන් සොයා මෙහෙයුමක් දියත් කර ඇති අතර තිරුක්කෝවිල් පොලිසිය වැඩිදුර විමර්ශනය කරනු ලබයි.

**10. දියේ ගිලී විදේශිකයෙකු මියයාම - හික්කඩුව පොලිස් වසම.**

2024.12.25 වන දින සවස් කාලයේ හික්කඩුව පොලිස් වසමේ දොඩන්දූව ප්‍රදේශයේ මුහුදේ දිය නාමින් සිටි විදේශීය ජාතික කාන්තාවක් හා පුද්ගලයෙකු දියේ ගිලී ඇති අතර, ප්‍රදේශවාසීන් විසින් ඔවුන් ගොඩට ගෙන කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පිරිමි පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වන ඉන්දීය ජාතිකයෙකි.**

මරණකරු තම දියණිය, පුතා සහ තවත් පුද්ගලයෙකු සමඟ මුහුදේ දිය නාමින් සිටියදී මෙසේ අනතුරට ලක්ව ඇති අතර කාන්තාව මරණකරුගේ දියණිය වේ. මෘතශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හික්කඩුව පොලිසිය වැඩිදුර විමර්ශනය සිදු කරනු ලබයි.

**11. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - අම්පාර පොලිස් වසම.**

2024.12.26 වන අද දින අළුයම් කාලයේ අම්පාර පොලිස් වසමේ සේනානායකපුර ප්‍රදේශයේදී පුද්ගලයෙකුට විදුලි සැර වැදී මියගොස් ඇති බවට අම්පාර පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ත් 40 ත් අතර පමණ වයසක පසුවන නවගම්පුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

විදුලි රැහැන් කණුවකට නැඟ එහි රැහැන් කැපීමට තැත් කිරීමේදී මෙලෙස විදුලි සැර වැදී මෙම පුද්ගලයා මියගොස් ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර අම්පාර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - රත්ගම පොලිස් වසම.

2024.12.25 වන දින උදෑසන කාලයේ රත්ගම පොලිස් වසමේ ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ කරාවේගොඩ ප්‍රදේශයේදී කරාපිටිය දෙස සිට අම්බලන්ගොඩ දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන මාර්ගය අයිනේ රැඳී සිටි පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ එම පුද්ගලයා රත්ගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 75 ක් වූ කුලීගොඩ, අම්බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, රත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - කිලිනොච්චිය පොලිස් වසම.

2024.12.25 වන දින සවස් කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ මහනුවර යාපනය ප්‍රධාන මාර්ගයේ කිලිනොච්චිය නගරයේදී, වව්නියාව දෙස සිට යාපනය දෙසට ධාවනය වූ ටිපර් රථයක් ඉදිරියෙන් එම දිශාවට ධාවනය වූ යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ටිපර් රථ රියදුරු, යතුරු පැදිකරු, පසු පැදිකාරිය සහ යතුරු පැදියේ සිටි ඔවුන්ගේ දැරියන් දෙදෙනා බරපතල තුවාල ලබා කිලිනොච්චිය රෝහලට ඇතුලත් කිරීමේදී එක් දැරියක් මියගොස් ඇත.

**මියගිය දැරිය වයස අවුරුදු 02 ක් වූ කනගාම්බියේකුලම්, කිලිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - අඟුරුවාතොට පොලිස් වසම.

2024.12.25 වන දින සවස් කාලයේ අඟුරුවාතොට පොලිස් වසමේ හොරණ මතුගම මාර්ගයේ මදුරාවල ගොඩමග මාර්ගයට හැරෙන හන්දියේදී, මතුගම දෙස සිට හොරණ දෙසට ධාවනය වූ බස් රථයක් ඉදිරියෙන් පැමිණි යතුරු පැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා හොරණ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වූ කනන්විල, අඟුරුවාතොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අඟුරුවාතොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - කහතුඩුව පොලිස් වසම.

2024.12.25 වන දින සවස් කාලයේ තහතුඩුව පොලිස් වසමේ තෝරමුල් අතුරු මාර්ගයේ දියගම ප්‍රදේශයේදී, කාර් රථයක් නිවසක සිට මාර්ගය දෙසට පිටුපසට ධාවනය කිරීමේදී එම මාර්ගයේ නිදා සිටි පුද්ගලයෙකු යටවී අනතුරක් සිදුව ඇත. අනතුරින් එම පුද්ගලයා බරපතල තුවාල ලබා හෝමාගම රෝහලට ඇතුලත් කර කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ දියගම, කිරිවන්තුඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කාර් රථයේ රියදුරු වශයෙන් සිටි කාන්තාව හදිසි අසනීප තත්ත්වයක් මත රෝහල් ගත කර ඇත. කහතුඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 16. මාරක රිය අනතුරක් - වව්නියාව පොලිස් වසම.

2024.12.25 වන දින රාත්‍රී කාලයේ වව්නියාව පොලිස් වසමේ කොවිල්කුලම් සිදම්බරපුරම් මාර්ගයේ 04 වන පටුමග ආසන්නයේදී, කෝවිල්කුලම් දෙස සිට සිදම්බරපුරම් දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන විදුලි රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු වව්නියාව රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වූ වඩුකොට්ටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වව්නියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**